සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved ]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# වර්ෂ අවසාන ඇගයීම - 2012
# வருட இறுதிக் கணிப்பீடு - 2012
# Year End Assessment - 2012

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය I හා II පත්‍රය<br>வாழ்க்கைத் தேர்ச்சியும் குடியுரிமைக் கல்வியும் பகுதி I - II<br>Life Competencies & Citizenship Education Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

නම/විභාග අංකය : ..........................................................................

පාසල : ..........................................................................

## I පත්‍රය

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

1. ඔබට පාසලේදී පිළිපැදිය හැකි සාරධර්මයක් වන්නේ ..........................................................................
.......................................................................... ය.
(සම්පත් රිසි පරිදි භාවිතා කිරීම, සම්ප්‍රදායන්ට අවනතව කටයුතු කිරීම, අවස්ථානෝචිතව එකිනෙකා හැර යාම)

2. න්‍යෂ්ටික පවුල් ඒකකවලට වර්තමානයේදී එල්ලවන අභියෝගයක් වන්නේ ..........................................................................
.......................................................................... ය.
(දරුවන්ට නිසි පෝෂණය හා ආරක්ෂාව ලැබීම, පවුලේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම, මව පියා දෙදෙනාම රැකියාවල නිරත වීම)

3. "හෙළයේ නවකතා සක්විති" ලෙස හඳුන්වන්නේ .......................................................................... මහතාය.
(මාර්ටින් වික්‍රමසිංහ, ටී. බී. ඉලංගරත්න, ඩබ්. ඒ. සිල්වා)

4. "මහා ශිව රාත්‍රී දිනය" සමරනු ලබන්නේ .......................................................................... ය.
(බෞද්ධ ආගමිකයන්ය, හින්දු ආගමිකයන්ය, ක්‍රිස්තියානි ආගමිකයන්ය)

5. "දිළිසෙන සියල්ල රත්තරන් නොවේ" යන ප්‍රස්තා පිරුළ මගින් අදහස් වන්නේ ..........................................................................
.......................................................................... බවයි.
(ලාභ ප්‍රශංසාවලදී උඩඟු නොවිය යුතු, දුටු පමණින් නොරැවටිය යුතු, ධෛර්ය සම්පන්නව කටයුතු කළ යුතු)

- අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

6. යහපත් පුරවැසියකු සතු අනිවාර්ය ගුණාංගයක් වන්නේ සුහදශීලී බවයි. (.........)
7. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයෙහි බෝපත් සංකේතය ඇතුළත්ය. (.........)
8. අන්‍ය ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම සදාචාරාත්මක යුතුකමකි. (.........)
9. රටක ජාතික කොඩිය අඩකුඹ කර තබන්නේ ජාතික ශෝක දිනයන්හිදීය. (.........)
10. මුද්‍රිත පණිවුඩයක් ඒ ආකාරයෙන්ම තවත් තැනකට යැවිය හැකි මෙවලම වන්නේ පරිගණක යන්ත්‍රයයි. (.........)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ඥාතීන් සමූහයකින් යුත් පරම්පරා තුනක් සහිත පවුලක් අප හඳුන්වන්නේ,
   (1) මහ පවුල (2) න්‍යෂ්ටික පවුල
   (3) විස්තෘත පවුල (4) කුඩා පවුල

12. සංස්කෘතිය පවරාදීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කරන ආයතනයකි.
   (1) පවුල (2) පාසල
   (3) ආගමික ස්ථානය (4) ඉහත සියල්ලම

13. දෙමාපියන් නොමැති අවස්ථාවල නායකත්වය දැරීම
   (1) දරුවන්ගේ වගකීමකි. (2) දරුවන්ගේ යුතුකමකි.
   (3) දරුවන්ගේ අයිතිවාසිකමකි. (4) දරුවන්ගේ හැකියාවකි.

14. ගැටුම් ඇතිවීමට ප්‍රධාන හේතුව වන්නේ,
   (1) එකිනෙකාට සවන් නොදීම. (2) චිත්තවේග පාලනය කිරීම.
   (3) සිතුම් පැතුම්වල සමානතාවක් තිබීම. (4) ආත්මාර්ථකාමී නොවීම.

15. පුද්ගලයකු ක්‍රීඩා හා විනෝදාංශවල යෙදීමෙන්
   (1) කායික හා මානසික සමබරතාව ඇති වේ. (2) වෙහෙස මහන්සිය ඇති වේ.
   (3) ඉවසීම හා සංයමය හීන වේ. (4) සැහැල්ලුව හා සතුට හීන වේ.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු නිවැරදිව යා කරන්න.

ශ්‍රී ලංකා ජාතික ධජයේ වර්ණ හා සංකේත නිවැරදි ලෙස යා කරන්න.

| | |
|---|---|
| 16. කොළ හා තැඹිලි පැහැති වර්ණ තීරු දෙක | ජාතීන් අතර සාමයට ඇති කැමැත්ත |
| 17. රතු පැහැති පසුබිම | සුළු ජාතීන් |
| 18. බෝපත් සතර | ජාතියේ අභිමානය |
| 19. කඩුවක් අතින් ගත් සිංහයා | සතර බ්‍රහ්ම විවරණ |
| 20. පසුබිම වටේ ඇති කහ පැහැති තීරුව | එඩිතර බව හා සැමට සාධාරණත්වය |
| | ආර්යය අෂ්ඨාංගික මාර්ගය |

(ල. 2x20 = 40)

## II පත්‍රය

- පළමු ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

1. 'ජන සමාජය තුළ අන්තර් සම්බන්ධතා' යන මාතෘකාව යටතේ තම ප්‍රදේශයේ පිහිටුවා ඇති ස්වේච්ඡා සංවිධාන පිළිබඳ ඔබ විසින් සකස් කරන ලද එම තොරතුරු වාර්තාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

   i) ඔබ ගමෙහි පිහිටුවා ඇති ස්වේච්ඡා සංවිධාන දෙකක නම් ලියන්න. (ල.02)

   ii) එම සංවිධානවල ක්‍රියාකාරීත්වය ගැන විමසීමට ඔබ තෝරා ගත්තේ එම සංවිධානවල කිනම් නිලධාරීන් දෙදෙනෙක්ද? (ල.02)

   iii) ඔබ තෝරා ගත් සංවිධානයක අරමුණු දෙකක් ලියන්න. (ල.02)

   iv) එම සංවිධානය මගින් ඔබේ ගමට සපයා ඇති සේවාවන් දෙකක් ලියන්න. (ල.02)

   v) වාර්තාව සැකසීම සඳහා ඔබට උදව් කළ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ල.02)

   vi) එම ක්‍රියාකාරකම කිරීමේ දී ඔබට මතු වූ ගැටලු දෙකක් ලියන්න. (ල.02)

   vii) එම ගැටලු විසඳා ගැනීමට ඔබ ගත් ක්‍රියාමර්ග දෙකක් සඳහන් කරන්න. (ල.02)

   viii) ක්‍රියාකාරකමේ දී ඔබ ලත් අත්දැකීම් දෙකක් ලියන්න. (ල.02)

   (ල. 2x8 = 16)

2. i) යහපත් පුරවැසියකු ලෙස ඔබ ප්‍රගුණ කළ යුතු සාරධර්ම දෙකක් ලියන්න. (ල.02)

   ii) සාරධර්ම සහිත පුද්ගලයන් නිසා සමාජයට අත්වන වාසි හතරක් ලියන්න. (ල.04)

   iii) පාසල් සමාජය තුළ දී ඔබට අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්විය හැකි අවස්ථා දෙකක් නම් කර ඉන් එක අවස්ථාවක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

3. i) විවේක කාලය අර්ථවත්ව හා ඵලදායීව ගතකිරීමට යොදාගත හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල.02)

   ii) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම තුළින් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ල.04)

   iii) "විවේකය ඵලදායී කර ගැනීමට ක්‍රීඩාව උපකාරී වෙයි." ක්‍රීඩා කිරීම තුළින් පුද්ගලයා තුළ වර්ධනය වන යහපත් ගුණාංග දෙකක් දක්වා ඉන් එකක් ඔබ ජීවිතයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

4. i) පුද්ගලයෙකු පිළිබඳ දත්ත හා තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල.02)

   ii) දත්ත හා තොරතුරු අධ්‍යයනය කිරීම තුළින් ලබා ගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ල.04)

   iii) එකම තොරතුර වුවත් මාර්ග කිහිපයකින් දැනගැනීමට හැකියාව ඇත. එවැනි තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය දෙකක් නම් කර එමගින් ලැබිය හැකි වාසි කෙටියෙන් පැහැදිලි කරන්න (ල.05)

5. i) පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතා ඇතිවීමට හේතු දෙකක් ලියන්න. (ල.02)

   ii) සමාජය තුළ අන්තර් සම්බන්ධතා ගොඩනැගෙන ආකාර හතරක් ලියන්න. (ල.04)

   iii) ජන සමාජයේ අන්තර් සම්බන්ධතා පවත්වන ආයතන දෙකක් නම් කර ඉන් එක් ආයතනයක් මගින් සිදුවන සේවාවක් විස්තර කරන්න. (ල.05)

6. i) 'ගැටුමක්' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල.02)

   ii) ගැටුම් ඇති වීමට හේතු හතරක් ලියන්න. (ල.04)

   iii) ගැටුම් අවම කරගනිමින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.05)

7. i) අප සංස්කෘතියේ ප්‍රබලව ක්‍රියාත්මක වන සංස්කෘතික උත්සව දෙකක් ලියන්න. (ල.02)

   ii) සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ල.04)

   iii) සංස්කෘති පවරාදීමට මූලිකව කටයුතු කරන ආයතන තුනක් නම් කරන්න. ඉන් එක ආයතනයක් සංස්කෘතිය පවරා දෙන ආකාරය විස්තර කරන්න. (ල.05)